## පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේදී විශේෂයෙන් සැලකිය යුතු කරුණු

01. පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වැලිගෙපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවකු හෝ ප්‍රාදේශීය සභා සීමාව තුළ පාසලක ඉගෙනීම ලබන්නෙකු හෝ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි රාජ්‍ය ආයතනයක ස්ථිර රැකියාවක නියුතු වූවකු විය යුතුය.

02. විදුහලක ඉගෙනුම ලබන්නේ නම් විදුහල්පති සහතිකය. (පාසැල් සිසුන් සඳහා)

03. ඇපකරු පාර්ලිමේන්තු / පළාත් සභා හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු / නීතිඥ වරයෙකු / වෛද්‍ය වරයෙකු සාමදාන විනිශ්චයකාරවරයෙකු / විහාරාධිපති ස්වාමීන් වහන්සේ කෙනෙකු හෝ රු. 167,880/- ට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ සංස්ථාවක නිලධාරීවරයෙකු විය යුතුය.

04. ස්ථිර පදිංචි කරුවකු බව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් සහතික කළ යුතුය.

05. සාමාජිකත්වය ලබා ගැනීමේදී රු. 40/- ක්ද (අවුරුදු 14 ට අඩු සාමාජිකයින් ළමා සාමාජිකයින් ලෙස සැලකේ) අළුත් කිරීම සඳහා රු. 30/- ක් ද තැන්පත් කළ යුතුය.

06. අවුරුදු 02 කට වරක් නියමිත අයදුම්පතක් මගින් සාමාජිකත්වය අළුත් කරවා ගත යුතුය.

07. තමාගේ ලිපිනය වෙනස් වූ වහාම ඒ බව පුස්තකාලයාධිපති වෙතට දන්වා නව ලිපිනය ඇතුළත් කර ගත යුතුය.

08. සාමාජිකත්වය වෙනත් කෙනෙකුට පැවරිය නොහැක. බැහැර ගෙනයන පොත් දින 14 ක් ඇතුළත ආපසු බාරදිය යුතු අතර, ප්‍රමාද වීමේදී එක් දිනකට එක් පොතක් සඳහා ශත 50 ක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ලැබේ.

09. පුස්තකාලයේ සාමාජිකයන් හා පාඨකයන් සෙසු පාඨකයන්ට හිරිහැරයක් නොවන ලෙස පුස්තකාල පරිශ්‍රයේදී හැසිරීමට වගබලා ගත යුතුය. නිශ්ශබ්දතාවය කඩ කිරීම, අවිනීත ලෙස හැසිරීම, පුස්තකාලය තුළ මත්පැන් හා දුම් පානය කිරීම, සාකච්ඡා පැවැත්වීම, පොත්පත් සඟරා ආදිය හා වෙනත් උපකරණවලට අලාභහානි කිරීම, නිකරුනේ කාලය ගත කිරීම හා පුස්තකාලයේ ගරුත්වයට හානි වනසේ හැසිරීම සාමාජිකත්වය අහෝසි වීමට හේතු විය හැක.

10. පොතක් නැති වූ විට වහාම පුස්තකාලයට දැනුම් දිය යුතුය. පොතේ වටිනාකම හා 25% ක දෙපාර්තමේන්තු ගාස්තුවක් ද සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

11. පොතක් බැහැර ගෙනයාමට පෙර හොඳින් පරීක්ෂා කර බලා ඉරීගිය පිටු අඩුවන හෝ අබලන් වූ තැන් පෙන්වා සටහන් කර ගත යුතුය. එසේ නොකර බැහැර ගෙනගිය පොත් ආපසු භාර දීමේදී පොත්වලට සිදු වී ඇති සියළු අලාභහානිවලට සාමාජිකයා වග කිව යුතු අතර, පොතේ සම්පූර්ණ වටිනාකම හෝ අලාභය වෙනුවෙන් තක්සේරු කරනු ලබන මුදලක් ගෙවීමට සිදු විය හැකිය.

12. පොතේ සඳහන් නියමිත දිනට ආපසු භාරදිය නොහැකි නම් තවත් දින 14 ක් සඳහා පමණක් තැපැල් මගින් හෝ වාචිකව හෝ දන්වා දීර්ඝ කරගත හැකිය.

13. විමර්ශන අංශයේ ඇති පොත් බැහැර ගෙනයාමට ඉඩදෙනු නොලැබේ. ඔබගේ ජාතික හැඳුනුම්පත නිලධාරියාට ලබා දී විමර්ශනය සඳහා ඔබගේ තොරතුරු තබා ඇති පොතෙහි සටහන් කරන්න.

14. සාමාජික අයදුම්පත් භාර දීමේදී තම අයදුම්පත රැගෙන පැමිණිය යුතුය.